**ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය - 2023**

---

ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2022 සැප්තැම්බර් 09 දිනැතිව එළඹි අංක 4205-එල්කේ දරන ණය ගිවිසුම සහ අංක 9229-එස්ආර්අයි (ඊඑෆ්) දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම සහ රට පුරා සිටින දිළිඳු සහ අවදානමට ලක්විය හැකි ජනතාවගේ ජීවනෝපාය ආරක්ෂා කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. දිළිඳු හා අවදානමට ලක්වූවන් සඳහා සෘජු මූල්‍ය ආධාර සිරස් සහ තිරස් ලෙස පුළුල් කිරීම සඳහා සහාය දැක්වීම, දිළිඳු හා අවදානමට ලක්වූවන්ගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා සහාය ලබා දීම සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ ආරක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කෙරේ. ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 74,090.15කට සමාන එ.ජ.ඩො. මිලියන 203.36ක් වූ අතර එම මුදල මූල්‍යකරණය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2022 සැප්තැම්බර් 09 වන ආරම්භ කරන ලද අතර 2024 අගෝස්තු 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශනය සහ එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දශෙය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තුවට අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් ඉටු කිරීම සඳහා වියදම් විෂයයන් 03 ක් යටතේ රු.8,577,500,000 ක් වෙන් කර ඇති අතර, පසුව මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර ඇති මුළු මුදල රු.7,118,648,822 ක් විය. මෙම මුදල් මාරුකිරීම්වලදී, ව්‍යාපෘතියේ වියදම් | ගොවීන්ගේ සහ අඩු ආදායම්ලාභී පවුල්වල ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා සහ CRM සහ Geogoviya තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැපයීම සඳහා 2023 අයවැය ඇස්තමේන්තුවලින් රු. මිලියන 8,577.50ක් වෙන් කර ඇත.<br><br>ගොවීන්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා වැය කර ඇති මුදල වූ රු. | ව්‍යාපෘතියේ අරමුණු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන නිසි ආකාරයෙන් වෙන් කළ යුතුය. |

| | | |
|---|---|---|
| අයිතම යටතේ එකතුව රු.4,207,602,965 ක් ද, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද අනෙකුත් ව්‍යාපෘති සඳහා එකතුව රු.2,911,045,856 ක් ද ගිණුම්ගත කිරීම සිදු කරන ලදී. මේ අනුව, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යථාර්ථවාදී අයවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. | 1,424,062,928 ක් එම වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කරන ලදී. 2022 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ ද, එම වර්ෂයේ දී සම්පූර්ණ කිරීමට නොහැකි වූ ගැබිණි මව්වරුන් සඳහා සහනාධාර ලබාදීම 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කළ බැවින් එම ව්‍යාපෘතිය තුළම අයිතම කේතය නිවැරදි කිරීම සඳහා රු. 1,533,200,000 ක් වූ ප්‍රතිපාදන මාරු කර ඇත.<br><br>රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත සමෘද්ධි වැඩසටහන 2023 ජූලි මාසයේ සිට "අස්වැසුම" වැඩසටහන ලෙස වෙනස් කරන ලද අතර ක්‍රියාත්මක කිරීමේ සංවිධාන ව්‍යුහය ද වෙනස් කරන ලදී. "අස්වැසුම" වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම නව ක්‍රමවේදයක් යටතේ සිදු කරන ලදී.<br><br>ඒ අනුව, සවිබල ගැන්වීම සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම මේ හේතුව මත ප්‍රමාද වී ඇත. එම නිසා, සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන 2023 වර්ෂයේදී සිදු කළ නොහැකි වූ අතර ඒ සඳහා වෙන් කළ ප්‍රතිපාදන ඉතිරි විය. මෙම සිදුවීම ව්‍යාපෘති කණ්ඩායමේ පාලනයෙන් ඔබ්බට සිදු වූවකි. මේ වනවිට "අස්වැසුම" වැඩසටහන සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබේ.<br><br>තවද, මෙම ව්‍යාපෘතියට අදාළ වියදම් නිවැරදි අයිතම කේතවලින් ගිණුම්ගත කිරීම සඳහා, මු.රෙ.66 යටතේ එම ව්‍යාපෘතිය තුළම ප්‍රතිපාදන මාරු කර ඇත. ඉන් පසුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය මත සහ රාජ්‍ය සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම අරමුණු කර ගනිමින් ඉතිරි ප්‍රතිපාදන වෙනත් උප ව්‍යාපෘතියකට මාරු කර ඇත. | |
| (ආ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දරන ලද තථ්‍ය වියදම් අදාළ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා ලබා ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වැඩියෙන් දක්වා තිබුණු මුදල වූ | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD) මගින් 2022 වසරට අදාළ වියදම් තහවුරු කිරීමෙන් අනතුරුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 2022 වර්ෂයට අදාළ වියදම් ගිණුම්ගත කළ | අදාළ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ නිවැරදි වියදම දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| රු.3,030,998,302 ක් සමාලෝචිත වර්ෂය තුළ නැවත ප්‍රකාශ කර තිබුණි. | අතර, 2023 වර්ෂයේදී සිදු කරන ලද ඇවර කිරීමේ ක්‍රියාවලියේදී 2022 වර්ෂයට අදාළ වියදම් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD) මගින් සංශෝධනය කරන ලදී. 2022 වර්ෂයේ දී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD) මගින් තහවුරු කරන ලද වියදම් සංශෝධනය කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම ගැළපීම සිදු කරන ලද අතර 2022 වර්ෂයට අදාළ වියදම් සංශෝධනය කරන ලදී. | |
| (ඇ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, 2022 දෙසැම්බර් සිට 2023 ජූනි දක්වා කාලය තුළ ගොවීන් 1,039,961ක් අතර රු.7,424,062,928ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ වාර්තාවලට අනුව, සහනාධාර ලබා දී තිබුණේ ගොවීන් 1,035,218ක් සඳහා පමණි. ඒ අනුව 4,743 ක හිඟයක් නිරීක්ෂණය විය. | මෙම විගණන විමසුමේ සඳහන් කර ඇති පරිදි, ගොවීන් සංඛ්‍යාවේ විෂමතාවයක් ඇති බැවින්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ (DAD) කොමසාරිස් ජනරාල්වරයා මගින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ (DAD) ප්‍රධාන මූල්‍ය නිලධාරි වෙත දැනුම් දෙන ලදී. අපට අවශ්‍ය තොරතුරු ලැබුණු පසු, අපි ඉදිරියේදී ඔබව දැනුවත් කරන්නෙමු. | නිවැරදි සංඛ්‍යා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.2 අරමුදල් උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දශෙය |
|---|---|---|
| (අ) මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දුන් එ.ජ.ඩො. මිලියන 200 ක ණය මුදලට අමතරව, JFPR විසින් ආසියානු සංවර්ධන බැංකුව හරහා අදාළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් මූල්‍යකරණය සඳහා එ.ජ.ඩො. මිලියන 3 ක ප්‍රදානයක් ලබා දීමට එකඟ වී ඇත. 2023 වර්ෂය සඳහා එම ප්‍රදානයෙන් එ.ජ.ඩො. මිලියන 0.1902ක් හෙවත් රු. මිලියන 68.36ක් වෙන් කර ඇත. කෙසේ වුවද, 2023 වර්ෂයේදී ව්‍යාපෘතිය සඳහා යොදවා තිබුණේ එ.ජ.ඩො. මිලියන 0.09ක් හෙවත් රු. මිලියන 33.57ක් හෙවත් සියයට 47ක් පමණි. | - | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වෙන් කර ඇති ප්‍රදානය ඵලදායී ලෙස සම්පූර්ණයෙන්ම භාවිතා කිරීම අවශ්‍ය වේ. |
| (ආ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ රජයේ ණය ගිණුම්කරණ පද්ධතියට අනුව, අරමුදල් භාවිතයට නොගැනීම හේතුවෙන් රු.15,105,802කට සමාන එ.ජ.ඩො. 45,801.27ක් 2024 මාර්තු 15 දින ණය දෙන නියෝජිතායතනයට බැඳීමේ ගාස්තු ලෙස ගෙවා තිබුණි. | එකඟ වෙමි. | වෙන් කර ඇති මුළු මුදල් කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| **3.1** | ADB ණය<br>සමාලෝචිත වර්ෂය තුළ සමාජ ආරක්ෂණ පද්ධතිවල (DSD හි CRM සහ DAD හි Geogovia) ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා එ.ජ.ඩො. මිලියන 2.65ක් හෝ රු. මිලියන 965.47ක් ඇස්තමේන්තු කර තිබුණද, එම පද්ධති සම්බන්ධයෙන් කිසිදු උපයෝජනයක් සිදු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD) සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ CRM පද්ධතිය වැඩිදියුණු කිරීමට යෝජනා කරන ලදී. එම පද්ධති වැඩිදියුණු කිරීමට පෙර, පවතින පද්ධති තක්සේරු කිරීමට සහ පද්ධතිවල අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, අධ්‍යයන කටයුතු අවසන් කර ඇති අතර වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලෙස ක්‍රියාත්මක කරන ආයතනවලට දැනුම් දී ඇත. ඒ අනුව, අදාළ පද්ධති වැඩිදියුණු කිරීම් ව්‍යාපෘති කාලසීමාව තුළ සිදු කිරීමට අපේක්ෂා කෙරේ. | අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීමට සහ වෙන් කරන ලද අරමුදල් උපරිම ලෙස භාවිතා කිරීම සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |
| **3.2** | (අ) ADB ප්‍රදාන<br>කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම අමාත්‍යාංශය යටතේ අවදානමට ලක්විය හැකි (කාන්තා, ළමුන් සහ ආබාධිත පුද්ගලයින්) සඳහා ඇස්තමේන්තුගත වියදම රු.695,394,000 ක් වූ හදිසි ආධාර සඳහා වන ප්‍රදාන යටතේ ඇති කාර්යයන් සම්බන්ධයෙන් 2024 මාර්තු 15 දිනට ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා සිදු කරන ලද විගණන පරීක්ෂණයේදී පහත සඳහන් නිරීක්ෂණ සිදු කරන ලදී. | | |
| (i) | මූල්‍ය ප්‍රගතිය වූයේ රු.182,271,606 ක් හෝ සමාලෝචිත වර්ෂය අවසාන ඇස්තමේන්තුවෙන් සියයට 27 ක් පමණි. | එකඟ වෙමි. | -එම- |
| (ii) | ප්‍රධාන ක්‍රියාකාරකම් 05ට අදාළ උප ක්‍රියාකාරකම් 12 ක් අත්හැර දමා තිබුණි. | එකඟ වෙමි.<br>මුල් ක්‍රියාකාරී සැලැස්මේ ඇතැම් ක්‍රියාකාරකම් කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය විසින් අත්හිටුවා (අවලංගු කර ඇත) ඇත. නව ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර ඇත. සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම 2024.03.22 දිනැති අංක NP/ADB/01/2022/MOW/CS | - එම - |

| | | |
|---|---|---|
| | දරන ලිපිය මගින් මෙම දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත. | |
| (iii) ප්‍රධාන ක්‍රියාකාරකම් 08කට අදාළ උප ක්‍රියාකාරකම් 24කට අදාළව කිසිදු ප්‍රගතියක් දක්නට නොලැබුණි. | සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව, මෙම කටයුතු ඉදිරියේදී ක්‍රියාත්මක කෙරේ. | -එම - |
| (ආ)කෘෂිකාර්මික උපදේශන සේවාවලට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයේ දී ලබා දුන් එ.ජ.ඩො. මිලියන 0.06 ක් හෝ රු. මිලියන 21.86 ක ප්‍රතිපාදන සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් අත් කර ගෙන නොතිබුණි. | මෙම කටයුතු ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | -එම - |
| (ඇ)2023/2024 වර්ෂ සඳහා කෘෂිකාර්මික දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් (GAP) සඳහා එ.ජ.ඩො. මිලියන 0.25 ක් හෝ රු. මිලියන 91.08 ක ප්‍රදාන වෙන් කර ඇත. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේ දී, රු. 57,353 ක් පමණක් භාවිතා කර තිබුණි. | එකඟ වෙමි.<br>මෙම ක්‍රියාකාරකම් සිදුවෙමින් පවතින අතර ව්‍යාපෘති කාල සීමාව තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇත. | -එම - |